# 21. පුරාණ වාරි කර්මාන්තය හා තත්කාලීන දේශපාලනය

එම්. ඩී. රණසිංහ

## හැඳින්වීම

**"පෙර කරන ලද අති විශාල වැව් කර්මාන්ත සමහර විට ලක්දිව තරම් ලොව අන් කිසිදු රටක දක්නට නොලැබෙන්නේ ය. මෙතරම් කුඩා වූ රටක මෙතරම් පැරණි වූ ද විශාල වූ ද සංඛ්‍යාවෙන් වැඩි වූ ද වැව් අමුණු තවත් ඇතැයි සිතිය නොහේ......** යනුවෙන් බදුලු දිසාවේ උප ඒජන්තව සිටි බේලි ලක්දිව වාරි කර්මාන්තය පිළිබඳ වාර්තාවක් සපයමින් දක්වා ඇති අදහසට අනුරූපීව ලක්දිව තුළ පැවති පුරාණ වාරි කර්මාන්තය ඉතා විශිෂ්ඨ හා විශ්මයජනක ස්වරූපයක් ගත් බව මනාවට පසක් වේ. මෙසේ ඉතා විශිෂ්ට වූ ලක්දිව වාරි පුරාණ ඉතිහාසය පුරාවිද්‍යාත්මක සාක්ෂි ඔස්සේ පිරික්සා බලන කළ එහි මූලාරම්භක අවස්ථාව පූර්ව ඓතිහාසික අවධිය කරා දිව යන අතර ඒ සඳහා කදිම නිදසුන් ලෙස දැදුරු ඔය, යාන් ඔය යනාදි ගංගා නිම්න ආශ්‍රිත පිහිටියා වූ මෙගලිතික ජනාවාස පෙන්වා දිය හැකිය.

වියළි කලාපය තුළ ජනාවාසකරණයට ලක් වීමත් සමගම පාරිසරික දේශගුණික ගැටලු, කෘෂිකාර්මික හා දෛනික අවශ්‍යතාවන්ට ජලය ප්‍රමාණවත් නොවීම යන කරුණු හේතු කොටගෙන වියළි කලාපය තුල වාරි කර්මාන්තය ස්ථානගත වූ අතර එම පතස් ආශ්‍රිතව ආරම්භ වූ කුඩා ප්‍රමාණයේ වාරි කර්මාන්තය කල් යත්ම විශාල ප්‍රමාණයේ වාරි කර්මාන්ත බවට පරිවර්තනය විය. ඒ සඳහා එකල පැවති සමාජ පසුබිම තුළ දේශපාලන තත්ත්වය තීරණාත්මක සාධකයක් බවට පත් විය. ඒ පරිපාලන යාන්ත්‍රණය මෙහෙයවීම හේතු කොටගෙන දේශපාලනමය තත්ත්වයන් කලින් කලට වෙනස් වීමත් සමඟ වාරි කර්මාන්තයේ දියුණුව සහ පරිහානිය සමානුපාතිකව සිදු වන අතර පුරාණ වාරි කර්මාන්තය එකල පැවැති දේශපාලනය අත්‍යන්ත වශයෙන් සම්බන්ධ වී ඇති ආකාරය පිළිබඳව හැදෑරීම මෙමඟින් සිදු වේ.

## ක්‍රමවේදය

දත්ත සපයා ගැනීම සඳහා මූලිකව සාහිත්‍යය මූලාශ්‍ර ද, ඊට අමතරව ප්‍රාථමික මූලාශ්‍ර ද ඇසුරු කොට ගෙන සකස් වූ ද්විතීක මූලාශ්‍ර, අන්තර්ජාලය යනාදිය අධ්‍යයන ක්‍රමවේද ලෙස යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරන ලදී.

## විමර්ශනය

ස්වාභාවික ජල මූලාශ්‍රයන් ඔස්සේ ආරම්භ වූ පුරාතන මානව සමාජය මිනිස් අවශ්‍යතා සපුරාලමින් ක්‍රමවත් වාරි පද්ධතියක් නිර්මාණයට දායක වූ එකල දේශපාලන අධිකාරය පුරාණ වාරි සමාජය තුළ ඩැනියල් පී. ලූකස් ඇතුලු පිරිස දක්වන පරිදි දේශපාලන-පරිපාලන නමින් උප පද්ධතියක් ලෙස පෙනී සිට ඇත. එයට රාජ්‍යත්වයේ සිට ග්‍රාමීය හෝ ගෝත්‍රික නායකත්වය දක්වා සියලුම ව්‍යුහයන් ඇතුලත් වූ අතර එය වාරි කර්මාන්තයේ වර්ධනයට සෘජු බලපෑමක් එල්ල කිරීමට සමත් විය. ජනාවාස විස්තරණය ස්වභාවයක් නොගැනීම, ජන සංඛ්‍යාව අධික නොවීම හේතු කොට ගෙන ප්‍රාදේශීය පාලකයන් විසින් කුඩා ගම් වැව් නිර්මාණය කිරීම වාරි කර්මාන්තයේ ආරම්භක අවස්ථාව ලෙස දක්වාලිය හැකිය. එය අභිලේඛන මූලාශ්‍ර තුළ **වපි හමික හෝ වවී** යන්න පරුමක යන නිල නාමය සමඟ යොදා තිබීමෙන් එය වඩාත් පැහැදිලි වේ.

හඳගල ලිපියෙහි **පරුමක දිගදතහන කොඩපික වපිහමික** යනුවෙන් යෙදීම ද, එසේම තවත් ශිලා ලිපියක **පරුමක මහවෙබලි යනුවෙන්ද** එසේම තෝනිගල සෙල්ලිපියෙහි පරුමක අභයගේ පුත් පරුමක තිස්සගේ වැව අචිඡගිරික තිස්ස පබ්බත විහාරවාසී භික්ෂූන්ට පූජා කර ඇති බව ද සඳහන් කොට ඇත. මෙහි දී පරුමකවරුන් යනු සෙල්ලිපි වියරණයේ යෙදුණු උගතුන් පවසන්නේ ප්‍රාදේශීය පාලකයන් බවත් මේ අනුව මුල් කාලයේ දී වාරි කර්මාන්තය කුඩා ගම්වලට සීමා වී ඇති බවත් මෙහි දී එකල ප්‍රාදේශීය පාලකයින් (ගම් ප්‍රධානින්) ගමට අවශ්‍ය ජල ප්‍රමාණයට සරිලන පරිදි වැව් නිර්මාණය සිදු කර ඇති බව ද මේ අනුව පැහැදිලි වේ.

රටක පරිපාලන ව්‍යුහය ගත් කළ දේශපාලන ක්‍රියාකාරිත්වය මත පදනම් වූ අතර මෙහි දී ඒ අතුරෙන් තම දේශපාලන බලය තහවුරු කර ගැනීම සඳහා වාරි නිර්මාණ යොදා ගැනිම එකල සිදු විය. එකල පරිපාලන සංවිධානය යටතේ මධ්‍ය පාලන තුළ රජු ප්‍රධානියා වූ නිසාවෙන් හා ඔහුගේ ප්‍රධාන වගකීමක් ලෙස වාරි කර්මාන්තය සඳහා පහසුකම් ලබා දීම අත්‍යවශ්‍ය වූ නිසාවෙන් රාජ්‍ය අනුග්‍රහය යටතේ වැව්, අමුණු නිර්මාණයෙහි යෙදීම ඒ යටතේ දැක්විය හැකිය. තව ද දේශපාලන අධිකාරියෙහි නියුතු පුද්ගලයන් තම බලය දිගු කාලීනව පවත්වා ගැනීමට නම් තමා වෙත ජනතා ප්‍රසාදය, අනුග්‍රහය නොඅඩුව පැවතිය යුතු අතර ජනතා පක්ෂපාතීත්වය පාලකයා වෙත නොමැති අවස්ථාවන්හි දී පාලකයාගේ බලය කෙටි කලකට සීමා වන බවත් ජනතා පක්ෂපාතීත්වය ඉහළ මට්ටමක ඇති විට පාලන කාලය දීර්ඝ වන බව අතීත දේශපාලන සංසිද්ධි අධ්‍යයනයෙන් පැහැදිලි වේ.

මෙහි දී ඒ සඳහා වාරි නිර්මාණයන් සිදු කිරීම දැක්විය හැකි අතර නිදසුන් ලෙස පරාක්‍රමබාහු රජු, වසභ රජු, පළමුවන විජයබාහු රජු, මහසෙන් රජු සාහිත්‍ය මූලාශ්‍ර ඔස්සේ පෙන්වා දිය හැකිය. අනුරාධපුර යුගයේ රජ කළ ආගමික වශයෙන් ඉතා පිළිගැනීමක් නොමැති මහාවිහාරික භික්ෂූන්ට වධහිංසයන්ට ලක් කර සහ ගෞරවයක් නොමැති, සමාජයේ අප්‍රසාදයට පත් පුද්ගලයෙකු වූ මහසෙන් රජු මින්නේරිය වැව, කවුඩුල්ල වැව, මහකනදරා වැව යනාදී වැව් නිර්මාණය කිරිමෙන් අනතුරුව ජනතාව අතර දෙවියෙකු බවට පත් විමය. එසේම පොළොන්නරු යුගය වන විට ජනතාව වෙත සමීප වීම සඳහා වාරි කර්මාන්තය යොදා ගත් අතර පළවන විජයබාහු රජ විසින් කැඩී බිඳී ගිය වැව්, අමුණු ප්‍රතිසංස්කරණය කරන ලද වාරිමාර්ග පිළිබඳව විස්තරයක් චූලවංශයේ සඳහන්ව තිබීම දැක්විය හැකිය. එහි දී ඔහු දිසවත්තුක වැව, දෙවන මොග්ගල්ලාන රජු විසින් නිර්මාණය කර ඇති පත්තපාසාන වැව, මහාසේන රජු විසින් නිර්මාණය කර ඇති මහාදාරගල්ල වැව, පළවන උපතිස්ස විසින් තනන ලද වලාහස්ස වැව, දෙවෙනි සේන රජු විසින් විශාල කළ බානුවාපි හෙවත් කාණ වාපි, එමෙන්ම පණ්ඩවාපි වැව, දෙවන අග්ගබෝධි තනන ලද එරන්ඩෙගල්ල වැව, තවද කුම්හිල සොබ්බක වැව, සරෙහරු වැව, කිත්තග්ගබෝධි පබ්බත වැව, මණ්වාටක වැව යනාදිය ප්‍රතිසංස්කරණය කිරීම මේ යටතට දැක්විය හැකිය. ඒ අනුව පැහැදිලි වන්නේ චෝල ආක්‍රමණිකයන් විසින් රට යටත් කර සිටි අභියෝගාත්මක අවස්ථාවේ බිඳ වැටී තිබුණු වාරි ප්‍රතිසංස්කරණය කරලීමට කටයුතු කිරීම තුළ රජය තව දුරටත් ජනතාවට සමීප කරමින් බලය ස්ථාවර කර ගැනීමට ගත් ක්‍රියා මාර්ගයක් ලෙස යොදා ගෙන තිබේ.

මෙහි උපරිම ඵල නෙලා ගනුයේ පළවන පරාක්‍රමබාහු රජය. ඔහු බලයට පත් වන්නේ දේශපාලන වියවුල් අතරින් බැව් මහාවංසයේ දක්වන අතර රාජ්‍ය බලය තමා වෙත නතු කර ගැනීමට හා ජනතා පක්ෂපාතීත්වය ලබා ගැනීම සඳහා විශාල ලෙස වාරි කර්මාන්තයෙහි නිරත වීම දැක්විය හැකිය. ඒ යටතේ පරාක්‍රම සමුද්‍රය නිර්මාණය කිරීම ද, දක්ඛිණ දේශයේ වැව්, අමුණු ප්‍රතිසංස්කරණය කර ඇති බව චූලවංශයේ සඳහන් වන අතර එහි දී ඔහු විසින් සෙට්ඨිවාපී, ගිරිබාවාපි, කොඩ්රින්ටන් නිකවැරටිය අසල හඳුනා ගෙන ඇති අම්බවාසාවාපි,

චත්තුන්නත වාපි, පටලවාපි, කාළි වාපි, කිරාවාපි, මොරවාපි, කොඩ්රින්ටන් ගල්ගමුව නිකවැව පාරේ සැතපුම් 8ක් පමණ නැගෙනහිරින් පිහිටි ගල්ගිරියාව වැව, නළනරු වාපි, හෙට්ටිපොලට සැතපුම් දෙකක් ගිනිකොණ දෙසින් හඳුනා ගෙන ඇති දැනට මලගනේ නමින් හඳුන්වන මුහුන්නරු හෙවත් මුනරු වාපි ද, ගිරියාවාපි, කසොල්ල වාපි යනාදි වැව් ප්‍රතිසංස්කරණය කිරීම සිදු විය.

කාලයාගේ  ඇවෑමෙන් මූල ඓතිහාසික යුගය වන විට ජන සංඛ්‍යාවේ සීඝ්‍ර ප්‍රසාරණය නිසා අවශ්‍යතා  සපුරා ගැන්මට, ජලය ප්‍රමාණවත් නොවීම නිසා ක්‍රිස්තු වර්ෂ පළවෙනි සියවස වන විට ලක්දිව වාරි කර්මාන්තයෙහි මධ්‍ය පරිමාණ හා මහා පරිමාණ  වැව් නිර්මාණය තුළ පුළුල් ව්‍යාප්තියක් දක්නට ලැබුණු අතර එහි පුරෝගාමියා බවට සාහිත්‍ය මූලාශ්‍රගත තොරතුරු අනුව වසභ රජු දැක්විය හැකි අතර ඔහු විසින් මානන්කැටිය, විලච්චිය යනාදි වැව් 11ක් නිර්මාණය කිරීම නිදසුන් ලෙස පෙන්වා දිය හැකිය. මෙලෙස වැව් නිර්මාණය කිරිම තුළ ජලය ප්‍රමාණවත් නොවීම මෙන්ම  අවශ්‍යතා  සපුරා ගැන්මේ යනාදි ගැටලුවලට පිළියම් ලැබීම හේතු කොටගෙන නිසා දේශපාලන වශයෙන් ස්ථාවර බවක් ඇති කර ගැන්මට වාරි කර්මාන්තය යොදා ගෙන ඇති අයුරු මින් පැහැදිලි වේ.

පරිපාලන කේන්ද්‍රස්ථානය තුළ පරිපාලිත සීමාව කරා බලය ව්‍යාප්ත කිරීම දේශපාලන ක්‍රියාවලියේ විශේෂ ලක්ෂණයකි. ඒ සඳහා විවිධ ක්‍රියාමාර්ග රාජ්‍යත්වය මඟින් අනුගමනය කර ඇති අතර පරිපාලන සීමාවේ පාරිසරික අභියෝගතා හඳුනාගෙන ඒවා අවම කිරීම දේශපාලන නායකත්වය සපයාලීම සඳහා වාරි කර්මාන්තය යොදා ගත්තේය. ජල හිඟයට පිළිමයක් ලෙස වැව් නිර්මාණයෙහි යෙදුණ ද එය රජු හා ජනතාව අතර සබඳතා වර්ධනය කළේය. ඒ තුළ  පරිපාලන  කේන්ද්‍රස්ථානය  තුළ පරිපාලිත සීමාව කරා බලය ව්‍යාප්ත කිරීමේ සාධකයක් බවට පත් විය. ක්‍රිස්තු වර්ෂ  පළවෙනි සියවසෙන් පසු මෙම තත්ත්වය විධිමත්ව සිදුව ඇති අතර එකල දේශපාලන අධිකාරිය වාරි කර්මාන්තයට සෘජු දායකත්වය ලබා දිම තුළ රජු හා  ජනතාව නියෝජනය කරන පරිපාලන කේන්ද්‍රස්ථානය සහ පරිපාලිත සීමාව අතර සබඳතාව වැඩි දියුණු වී ඇති බැව් පැහැදිලිය. මේ සඳහා නිදසුනක් ලෙස අමුණුවල භාවිතය දක්වාලිය  හැකිය. ඒ අමුණ මඟින් බොහෝ දුරකට ජලය රැගෙන යාම සිදු වන නිසාවෙනි.

අමුණ පිහිටි ප්‍රදේශයේ ජනතාව අමුණ නිර්මාණය කිරීමට විරුද්ධ වීම හෝ විනාශ වීමේ ක්‍රියාවලියට දායක වීම සිදු විය හැකි අතර කෙසේ නමුත් අතීතයේ එවැනි ක්‍රියාවන් සිදු වී නොමැති අතර ඒ ජනතාව රජුගේ අණසකට යටත් වීම නිසාවෙන් බව මනාවට පැහැදිලි වේ. එම මධ්‍ය බලය ජනතා සුභ සාධනය පදනම් කරගෙන පර්යන්තය වෙත බෙදා හැරීමේ ක්‍රමවේදයක් මත සිදුවන්නට ඇති බව දැක්විය හැකි අතර ඒ ජනතාව විසින් වාරි කර්මාන්තය ආරක්ෂා කිරීමට පෙළඹීම නිසා ය. උදාහරණ ලෙස, පළවන අග්ගබෝධි රජු විසින් කරවන්නට යෙදුන මිණිපේ අමුණ, දෙවන උදය රජු විසින්  මහානදිය හෙවත් වළවේ ගඟ හරස්  කොට ඉදි කරන ලද අමුණ මේ යටතට පෙන්වා දිය හැකිය.

එකල දේශපාලනික ක්‍රියාවලිය සඳහා ප්‍රභූ යයි සම්මත ජනතාව වන අතර මොවුන් නගර මධ්‍ය කේන්ද්‍ර කොට ගෙන ගොඩනැගෙන මහා සංස්කෘතියට අයත් වන අතර ක්‍රිස්තු පූර්ව 300 සිට ක්‍රිස්තු වර්ෂ 100 දක්වා කාලය තුල මහරජ, රජ, පරුමක, ගමික, ගමණී යනාදිය වශයෙන් දක්නට ලැබිණ. ක්‍රිස්තු වර්ෂ පළමු සියවස වන තුරු අනුරාධපුරය හා තදාශ්‍රිත ප්‍රදේශවලට සීමා වූව ද වසභ රජු විසින් මෙම ක්‍රියාවලිය වෙනසකට ලක් කිරීම තුළ අගනුවරින් පිටත පෙදෙස්වල ද දේශපාලන අධිකාරය දක්නට ලැබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස වාරි කර්මාන්තය පදනම් කරගෙන රාජකාරි ක්‍රමය බිහි විය. එකල දේශපාලනය සහ වාරි කර්මාන්තය දැඩි ලෙස සමීප සම්බන්ධතා පවත්වා ඇති බව පැහැදිලි වන අතර වාරි

කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා හසල දැනුමක් ඇති නිලධාරීන් පත් කිරීම එකල දේශපාලන අධිකාරිය විසින් ගත් සාධනීය ක්‍රියාමාර්ගයක් ලෙස හඳුන්වා දිය හැකිය. එකල රාජ්‍ය නිලධාරීන් රාජ්‍ය අධීක්ෂණය යටතේ වාරි කර්මාන්තයට යොදා ගැනීම් තුළ තම රාජකාරිය නිසි අයුරින් කිරීමට පෙළඹෙන අතර ඉහළ දේශපාලන අධිකාරියට රාජ්‍ය නිලධාරියා පෞද්ගලිකව වගකීමට බැඳී සිටින නිසාවෙන් වාරි කර්මාන්තයේ වර්ධනය උදෙසා ක්‍රියා කිරීම නිරායාසයෙන්ම සිදු වූ අතර වාරි කර්මාන්තයෙහි අභිවෘද්ධිය දිනෙන් දින දියුණු වූයේ යයි පැවසීම යුක්ති සහගත වේ. එපමණක් නොව මෙමගින් ප්‍රධාන පාලකයා වෙත ජනතා ආකර්ෂණය නිරායාසයෙන් ලබා ගැන්මට මෙන්ම පාලකයා හා ජනතාව අතර සම්බන්ධතාවය වඩා වර්ධනය වීමට ද මෙය හේතු වූ බැව් පැවසිය යුතුමය.

එකල රාජ්‍ය පරිපාලන නිලධාරීන් පිළිබඳ තොරතුරු අභිලේඛන මූලාශ්‍ර මඟින් සපයන අතර ඒවා මේ අයුරින් දැක්විය හැකිය. දඹුල්ලේ ඇති ලෙන් ලිපියක **අණනික තිශ** යනුවෙන් දක්වා ඇති අතර සෙනරත් පරණවිතාන ශූරීන්ට අනුව **අණනික තිශ** යනු වාරි ඉංජිනේරු තනතුර හැඳින්වීම සඳහා යොදන පර්යාය පදයක් බව පෙන්වා දැක්විය හැකිය. ඊට අමතරව කෑගලු දිස්ත්‍රික්කයේ මාපිටි ලෙන් ලිපියක **අඩිකය උතර** යන්නේ සඳහන් වී ඇති අතර මෙහි දී ඇළ මාර්ග භාරව සිටි නිලධාරීයෙක් හැඳින්වීමට යොදාගෙන ඇති බව හඳුනාගෙන ඇත. එපමණක් නොව දෙවැනි සේන රජු කාලයට අයත් මිහින්තලේ සෙල්ලිපියක **වැවැජැරුව** නම් නිලයක් දැක්වෙන අතර ඉන් ප්‍රකාශ වන්නේ වාරි කර්මාන්තය පිළිබඳ විධායක නිලධාරීයෙක් සම්බන්ධ බව නවවෙනි හා දහවන සියවස්වලට අයත් අත්තාණි ටැම්ලිපිවල සඳහන් **වියෝ වදාරන්නන්** වාරි කර්මාන්ත පරීක්ෂකයන් විය හැකි බව එස් ඩබ්ලිව් කොඩ්රිංටන් මහතා උපකල්පනය කරයි.

එසේම පොළොන්නරු රජ මාළිගාව ටැම් ලිපියේ සඳහන් වන් **පෙරවරිබුද්** නැමැති නිලධාරියා ඇළ මාර්ගවල ජලය කෙත්වතුවලට බෙදී යන සීමා නිර්නය කරන පුද්ගලයා විය හැකි බව එච්. ටී බස්නායක මහතා ප්‍රකාශ කර තිබේ.තව ද දෙවන සේන රජුගේ අනුරාධපුර අභය වැව ටැම් ලිපියට අනුව අභය වැවේ මසුන් අල්ලන පුද්ගලයන්ට දඬුවම් කිරීමට **මාඬබියා** නම් නිලධාරියෙක් සිට ඇති බවත් ඔවුන් වාරි නිලධාරියෙක් ලෙස හඳුන්වා දීමට හැකියාවක් නොමැත්තේ ඔවුන් විසින් එක් රාජකාරියකට පමණක් සීමා නොවී ඇති බවට සාධක හමු වීම නිසාය. දහවැනි සියවසට අයත් ටැම් ලිපියක **තලා අරුත් හා තලා අරක්ක** වැදැරුම් ලෙස තනතුරු දෙකක් දක්වා ඇති අතර තලා යන්න ජල තලාව විල් යනාදිය අර්ථ නිරූපණයට යොදා ගත් බව රුවන් මල් නිගණ්ටුවෙහි දැක්වේ. මෙහි අරක්ක යනු ආරක්ෂක යන අර්ථය නිරූපණය වන බව හඳුනාගෙන ඇති අතර මේ අනුව පදගත තේරුම් අනුව ජලාරක්ෂක විධායක තනතුරක් බව අනුමානය කළ හැකිය. ශිලා ලිපිවල වැව් මෙහෙ යන වදන් වලින් වාරිමාර්ග ඉදිකිරීමට නඩත්තුව සඳහා ලබාගත් රාජකාරිය හැඳින්වීමට යොදාගෙන ඇත. මෙහි දී අතුරුපොලයාගම අත්තාණි කණුවේ **දොළොස් මහ වැතැන්** නම් නිලධාරියෙකු පිළිබඳ වන අතර ඔහු විසින් වැව් තැනීමට අවශ්‍ය ශ්‍රමය ලබා ගැනීම කාර්යයභාරය විය.

මේ අනුව ජලාරක්ෂක විධායක තනතුරු වාරි කර්මාන්ත පරීක්ෂකරුවන් යන ආදී සෑම ක්ෂේත්‍රයක්ම ආවරණය වන පරිදි පුහුණු රාජ්‍ය නිලධාරී මණ්ඩලයක් එකල දේශපාලන අධිකාරිය මඟින් පත් කිරීම හේතුකොටගෙන වාරිකර්මාන්තය විශාල ලෙස ප්‍රසාරණය වූ අතර වාරිකර්මාන්තය නිසා දේශපාලන වශයෙන් එක්තරා ආකාරයකට වැඩවසම් ලක්ෂණ පෙන්නුම් කර ඇති බව සඳහන් කළ යුතුය. එසේම කලින් කලට දේශපාලන වෙනස් වීම් සිදුවීමේ දී දුරදර්ශී පාලකයන් සහ අදුරදර්ශී පාලකයන්ද බලයට පත් වූ අවස්ථා ඇති බව වංසකතා මඟින් පැහැදිලි වන අතර වර්තමානයේ ද මෙම තත්ත්වය දැකිය හැකිය. දූරදර්ශි

පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ දියුණුව ද අදූරදර්ශි පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ පරිහානිය ද සිදු වූ අතර පොළොන්නරු රාජධානියේ අග භාගය ඊට කදිම නිදසුන් සපයයි.

**නිගමනය**

යථෝක්ත කරුණුවලට අනුරූපීව පුරාණ වාරි කර්මාන්තය හා තත්කාලීන දේශපාලනය එකිනෙකට අත්‍යන්ත වශයෙන් සම්බන්ධ වී ඇති බවත් එක් අංශයක වෙනස් වීම අනෙක් අංශයේ වෙනස් වීමට ඍජුව උපස්ථම්භක වන බවත් ඒ අනුව සමානුපාතිකව වෙනස්වීය යන බවත් දැක්විය යුතුය. නිදසුන් ලෙස දූරදර්ශී පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ දියුණුව ද අදූරදර්ශි පාලකයන් මඟින් වාරි කර්මාන්තයේ පරිහානිය ද සිදු වීම දැක්විය හැකි අතර වාරි කර්මාන්තය ආශ්‍රයෙන් එකල දේශපාලන හා පරිපාලන යාන්ත්‍රණය ගොඩනැගී ඇති බවත් එකල දේශපාලන අධිකාරිය මඟින් ගනු ලැබූ ක්‍රියාමාර්ග නිසා කාලයාගේ ඇවෑමෙන් කුඩා ප්‍රමාණයේ වාරි කර්මාන්තය කල්යත්ම විශාල ප්‍රමාණයේ වාරි කර්මාන්ත බවට පරිවර්තනය වූ බැව් මනාවට පසක් වේ. එපමණක් නොව දේශපාලන අධිකාරය තම බලය තහවුරු කර ගැන්මට ජනතා ප්‍රසාදය ලබා ගැනීමට මෙන්ම රජය හා ජනතාව අතර සබඳතාව ගොඩනැගීමට පුරාණ වාරි කර්මාන්තය යොදා ගෙන ඇති බැව් මනාවට පැහැදිලි වේ.

**පරිශීලන**


අමරවංශ, කේ, (1969) **ලක්දිව සෙල්ලිපි,** කොළඹ 10, ඇම්. ඩි ගුණසේන සහ සමාගම

බස්නායක, එච්. ටී, (1997), ***පුරාණ ශ්‍රී ලංකාවේ ජල ශිෂ්ටාචාරය***, එස්. ඇන්ඩ්. එස් ප්‍රින්ටර්ස්, 49 ජයන්ති වීරසේකර මාවත, කොළඹ 10.

මෙන්ඩිස්, ඩී. ටී. (2017), ***පුරාණ අනුරාධපුර සංස්කෘතික භූ දර්ශනය***, කොළඹ 10, ඇස් ගොඩගේ සහ සමාගම.

විතානච්චි, සී. ආර්., (2020), ***ශ්‍රී ලංකාවේ පුරාණ අමුණ හා සම්බන්ධ දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ විමසුමක්***

විතානාච්චි, සී. ආර්., (2012) ***පුරාණ වාරි මාර්ග විකාශය හා පරාක්‍රම සමුද්‍රය, ශ්‍රී ලාංකේය ඉතිහාසය,*** වෙළුම සසල කොළඹ, ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 355-380 පිටු.

සෙනවිරත්න, ඒ (1998), ***පොළොන්නරුව***, වාරිමාර්ග දෙපාර්තමේන්තුව - කොළඹ

සෙනවිරත්න, ඒ(2006***), ඥාන දර්ශන***, කොළඹ 10 ,ඇස් ගොඩගේ සහ සමාගම.

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි,බටුවන්තුඩාවේ දේව රක්ෂිත පඬිතුමා (සංස්),(1967), ***මහාවංස සිංහල***, කොළඹ රත්නාකර පොත් වෙළඳ සමාගම.